# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/47 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාද — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68(50)/75.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත**

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වි. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වන දින,
නුවරඑළියේ
ජනාධිපති කාර්යාලයේ දී ය.

**නියෝග**

1. මේ නියෝග 1975 අංක 2 දරන හදිසි අවස්ථා (තේ වතු කම්කරුවන්ගේ වේතන පරිපූරක) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ නියෝගවල කාර්යයන් සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේ ය.

(2) මේ නියෝග යටතේ නියම බලධරයා වෙත පැවරී ඇති හෝ නියම වී ඇති බලතල, කටයුතු හෝ කාර්යයන් කිසිවක් ඒ නියම බලධරයා විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද මේ නියෝගවල විධිවිධාන වලංගුව බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ නියෝගවල විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති අවස්ථාවක ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මේ නියෝගවල විධිවිධාන බලපැවැත්විය යුතු ය.

4. ප්‍රමාණය අක්කර එක සියයකට අඩු නොවන යම් තේ වත්තක සේවයෙහි නියුක්ත යම් කම්කරුවකුගේ සෑම සේවා යෝජකයකු ම විසින්, 1975 අප්‍රේල් මස 1 වන දින සහ ඉන් පසුව, මෙහි උපලේඛනය ප්‍රකාර ආගණනය කරන ලද වේතන පරිපූරකයක්, එම කම්කරුවා වැඩ කරන එක් එක් දිනය වෙනුවෙන් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

5. 1975 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ම යම් සේවා යෝජකයකු විසින් තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි සේවයෙහි නියුක්ත කර ගනු ලැබ සිටි 4 වන නියෝගයෙහි සඳහන් සෑම කම්කරුවකු ම, ඒ සේවා යෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩව සේවය කරන තාක් කල්, 1975 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම වූ දිනයෙහි ඔහු භුක්ති විඳිමින් සිටි වැටුප, දීමනා හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් වුව ද හඳුන්වනු ලබන මුදලින් වූ වෙනත් ගෙවීම්වලට අදාළ නියමයන්ට හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි පිට ඒ සේවා යෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි යොදවනු ලැබිය යුතු අතර, මෙම නියෝග යටතේ ගෙවිය යුතු වේතන පරිපූරක, ඒ වැටුප, දීමනා හෝ වෙනත් ගෙවීමට අතිරේකව විය යුතු ය.

6. තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි නියුක්ත යම් කම්කරුවකුට මේ නියෝග ප්‍රකාර ගෙවිය යුතු වේතන පරිපූරකය, යම් ලිඛිත නීතියක හෝ වෙනත් යම් කටයුත්තක කාර්යයන් සඳහා ඔහුගේ වේතනයේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

7. 4 වන නියෝගය යටතේ කම්කරුවකුට ගෙවනු ලැබීමට නියමිත යම් මුදලක් ගෙවීම යම් සේවා යෝජකයකු විසින් පැහැර හරිනු ලැබීම හේතුකොටගෙන අධිකරණයක් විසින් ඒ සේවා යෝජකයා වරදකට වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ වරද සඳහා නියම කරනු ලැබිය හැකි වෙන යම් දඬුවමකට අතිරේකව, ආඥාවෙහි සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල කම්කරුවාට ගෙවන ලෙස එම අධිකරණය විසින් ඒ සේවා යෝජකයාට ආඥා කළ හැකි අතර, ඒ මුදල එසේ නොගෙවනු ලැබුව හොත්, එය අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක් වූ ලෙස අධිකරණයේ ආඥාවක් පිට අයකර ගනු ලැබිය හැකි ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මෙම නියෝගවල—

" කොමසාරිස්වරයා ", " සේවා යෝජකයා " සහ " වේතන " යන යෙදුම්වලට පිළිවෙළින් පඩි පාලක සභා ආඥා පනතෙහි දී ඇති අර්ථ ම ඇත්තේ ය ;

" තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය " යන්නට එම කර්මාන්තය සම්බන්ධයෙන් පඩි පාලක සභා ආඥාපනතෙහි 6 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් කරනු ලැබූ නියමයෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

" සියලු මැදරට තේ සඳහා මාසික සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිළ " යන්නෙන් කම්කරු කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කරනු ලැබ එක් සිංහල, එක් දෙමළ සහ එක් ඉංග්‍රීසි පුවත්පතක පළ කරනු ලබන කොළඹ තේ වෙන්දේසියේ සියලු මැදරට තේ සඳහා වූ මාසික සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිළ අදහස් වේ.

## උපලේඛනය

| I වන තීරය | | II වන තීරය |
|---|---|---|
| ඉකුත් මාසය සඳහා කොළඹ තේ වෙන්දේසියේ දී සියලු මැදරට තේ සඳහා මාසික සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිළ— | | එක් කම්කරුවකුට එක් දිනයකට ගෙවිය යුතු වේතන පරිපූරකය— |
| (අ) රු. 2.50 සිට රු. 2.74 දක්වා වන අවස්ථාවක | ... | ශත 10 කි |
| (ආ) රු. 2.75 සිට රු. 2.99 දක්වා වන අවස්ථාවක | ... | ශත 20 කි |
| (ඇ) රු. 3.00 හෝ ඊට වැඩිවන අවස්ථාවක | ... | ශත 30 කි |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී